# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/2 - 2016 මැයි මස 02 වැනි සඳුදා - 2016.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3ඇ වගන්තිය යටතේ නියමය

2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2016.05.02 සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි උපලේඛනය මගින් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් වන බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

එම පනතේ 3 ඇ වගන්තිය යටතේ 2015.11.20 දිනැති අංක 1941/30 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

(1) ශ්‍රී ලංකා රජය විසින් විදේශීය සංවිධාන හා විදේශීය රාජ්‍යයන් සමග එළඹී ඇති නොයෙකුත් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ/භාණ්ඩ.

(2) කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත 30% කට නොඅඩු දේශීයව එකලස් කළ හෝ එකතු කළ අගයක් සහිතව මෙරට එකතුකළ නිෂ්පාදනය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 84 හා 85 කාණ්ඩයන්ට අයත් වන භාණ්ඩ.

(3) රේගු ආඥාපනතේ 107 (අ) වැනි වගන්තිය යටතේ පනවනු ලැබ ඇති මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීම) රෙගුලාසි යටතේ තීරු බදු රහිතව නිශ්කාෂණය කර ගැනීමට හිමිකම් ලබන සෑම භාණ්ඩයක්ම (235 පරිච්ඡේදය).

(4) නැව් ගබඩා බඩු ලෙස පාවිච්චි කිරීම සඳහා ප්‍රතිඅපනයනය කිරීම පිණිස බන්ධිත ගුදමින් නිශ්කාෂණය කරනු ලබන සෑම භාණ්ඩයක්ම.

1A - PG 2942 — 507 (2016/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(5) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර යම් අපනයනකරුවෙකු වෙත සපයනු ලබන සෑම භාණ්ඩයක් ම එම නිෂ්පාදනය කරන ලද භාණ්ඩය අපනයනය කරන ලද බවට නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ලියකියවිලි ඉදිරිපත් කරන්නේ නම් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත එවැනි භාණ්ඩ.

(6) පාර්ලිමේන්තු කටයුතු විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ 8 වැනි පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ආනයනය කරන ලද මිල, රක්ෂණය සහ ගැල් කුලිය ඇතුළත් වටිනාකම (CIF value) ඇමෙරිකන් ඩොලර් 62,500/- හෝ යූරෝ 55,000/- හෝ ජපන් යෙන් මිලියන 7.0 නොඉක්මවන වාහනයක්

05 - 508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.